# කාර්ය සාධන වාර්තාව සහ ගිණුම් - 2014

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ගාල්ල

# செயற்றிட்ட அறிக்கை மற்றும் கணக்கு - 2014

மாவட்டச் செயலகம் - காலி

# Performance Report & Accounts - 2014

District Secretariat - Galle



## පටුන


| අනු අංකය | විෂයය | පිටු අංකය |
|---|---|---|
| | ගරු අමාත්‍යතුමාගේ පණිවුඩය | 2 |
| | ලේකම් තුමාගේ පණිවුඩය | 3 |
| | ගාල්ල දිස්ත්‍රික් ලේකම් තුමාගේ පණිවුඩය | 4 |
| 01. | ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හැඳින්වීම | 5 |
| | 1. දැක්ම, මෙහෙවර | 5 |
| | 2. අරමුණු | 6 |
| | 3. කාර්යයන් | 6 |
| | 4. දිස්ත්‍රික් ලේකම් අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක අනුබද්ධිත කාර්යාල | 7 |
| 02 | ගාල්ල දිස්ත්‍රික්කය හැඳින්වීම | 8 - 12 |
| 03. | සංවිධාන ව්‍යුහය | 13 |
| | 1. සංවිධාන සටහන | 14 |
| 04. | දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සාමාන්‍ය පරිපාලනය | |
| 4.1 | 2014 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට සමගාමීව කරන ලද කාර්යයන් | |
| | 1. ව්‍යාපෘති අනුව ප්‍රතිපාදන හා සත්‍ය වියදම | 15 - 17 |
| | 2. ග්‍රාම නිළධාරී කටයුතු | 18 |
| | 3. අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රගතිය - 2014 | 18 |
| | 4. විමර්ශන හා මෙහෙයුම් ඒකකයේ ප්‍රගතිය - 2014 | 19 |
| | 5. රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම - 2014 | 19 |
| | 6. දිස්ත්‍රික් ලේකම් විසින් රැස් කරන ලද ආදායම -2014 | 19 - 21 |
| | 7. පොදු තැන්පත් ගිණුම - 2014 | 21 |
| | 8. රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වල ගෙවීම් ප්‍රගතිය | 22 - 23 |
| | 9. පුහුණු කිරීම් කටයුතු වල ප්‍රගතිය - 2014 | 23 - 25 |
| | 10. ප්‍රාදේශීය පරිපාලනයේ කාර්යක්ෂමතාවය වැඩි කිරීම සඳහා පවත්වන ලද රැස්වීම් | 26 |
| | 11. හෝල් දි ගෝල් ශාලාවේ ආදායම - 2014 | 26 |
| | 12. ඉඩම් රෙජිස්ට්‍රාර් කටයුතු වල ප්‍රගතිය - 2014 | 27 |
| | 13. ලියාපදිංචි කිරීම් කටයුතු වල ප්‍රගතිය - 2014 | 27 - 28 |
| | 14. හැඳුනුම්පත් නිකුත් කිරීමේ ප්‍රගතිය - 2014 | 28 |
| | 15. මෝටර් රථ අංශයේ ප්‍රගතිය | 28 |
| | 16. විශ්‍රාම වැටුප් ගෙවීමේ ප්‍රගතිය | 29 |
| | 17. පාරිභෝගික කටයුතු ඒකකයේ ප්‍රගතිය - 2014 | 29 |
| | 18.මිනුම් ඒකක හා ප්‍රමිති සේවා අංශයේ ප්‍රගතිය - 2014 | 29 - 30 |
| | 19. ආපදා සහන සේවා කටයුතු වල ප්‍රගතිය - 2014 | 30 |
| 4.2 | සමාජ සේවා සහ සංස්කෘතික වැඩ සටහන් වල ප්‍රගතිය - 2014 | |
| | 1. සංස්කෘතික හා ආගමික කටයුතු වල ප්‍රගතිය - 2014 | 31 - 32 |
| | 2. සමාජ සේවා වැඩ සටහන් වල ප්‍රගතිය- 2014 | 33 - 34 |
| | 3. ක්‍රීඩා අංශයේ ප්‍රගතිය - 2014 | 35 |
| 4.3 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සංවර්ධන කටුයුතු වල ප්‍රගතිය - 2014 | |
| | 1.ක්‍රම සම්පාදන අංශයේ සංවර්ධන කටයුතු වල ප්‍රගතිය | 35 - 36 |
| | 2.කෘෂි කර්ම අංශයේ සංවර්ධන කටයුතු වල ප්‍රගතිය | 36 - 37 |
| | 3. දිවි නැගුම අංශයේ සංවර්ධන කටයුතු වල ප්‍රගතිය | 38 - 40 |
| | 4. වෘත්තීය මාර්ගෝපදේශ හා ඵලදායිතා අංශයේ ප්‍රගතිය | 41 - 43 |
| | 5. කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ ප්‍රගතිය | 43 |
| | 6. ද්වි භාෂා සහන කවුළුවේ ප්‍රගතිය | 44 |
| | 7. සමාජ ඵලදායිතා අංශයේ ප්‍රගතිය | 44 - 46 |

**ගරු අමාත්‍යතුමාගේ පණිවුඩය**

**මනුෂ්‍යත්වයෙන් පිරි රාජ්‍ය සේවයක පෙර ගමන් කරුවන් වෙමු ........**



යහපාලනය සංකල්පය කේන්ද්‍රකරගත් සදාචාරාත්මක සමාජයක් ස්ථාපිත කිරීමේ අරමුණු පෙරදැරි කරගත් මෙම යුගය, ශ්‍රී ලාංකීය සමාජය අභිමුඛව ඇති සුවිශේෂ අවස්ථාවකි. එම අරමුණ සාක්ෂාත් කරගනු වස් සිවිල් පරිපාලනය සාධනීය ප්‍රතිසංස්කරණයන්ට ලක්කිරීමේ අවශ්‍යතාවය 2015 වසරේ දී අප විසින් සපුරා ගතයුතුව ඇති ප්‍රබලම අවශ්‍යතාවයයි.

ජනතා පරමාධිපත්‍ය ඉටුවන පරිදි යහපාලන සංකල්පය කේන්ද්‍රකරගෙන රාජ්‍ය සේවකයින් විසින් රජයේ සැලසුම් හා තීරණ ගැනීමේ ක්‍රියාවලියට දායක කරගැනීම හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල පුරවැසි අවශ්‍යතාවයන්ට වගවීමෙන් හා පාරදෘශ්‍යභාවයෙන් යුතුව ප්‍රතිචාර දැක්වීමක් වශයෙන් හඳුනා ගත හැකිය.

අභිනව රජයේ දින 100 වැඩ පිළිවෙළ යටතේ එළිදැක්වීමට නියමිත ව්‍යවස්ථා සංශෝධන, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය පාලනය වඩාත් කාර්යක්ෂම සහ ඵලදායීව ක්‍රියාත්මක කිරීමේ ප්‍රායෝගික සැලසුම් නිර්මාණයටත් අදාළ ප්‍රධානතම වගකීම පැවරී තිබෙන්නේ රජයේ ප්‍රමුඛ අමාත්‍යාංශයක් වන ස්වදේශ කටයුතු අමාත්‍යාංශයටය.

21 වන ශතවර්ෂයට ගැලපෙන පරිදි නව තාක්ෂණික ක්‍රම උපයෝගී කරගනිමින් මූල්‍ය ප්‍රතිපත්ති අනුව කටයුතු කරමින් පුරවැසියන්ගේ බදු මුදල් වියදම් කරන ආකාරය සහ එහි කාර්ය සාධනය මැනීමට හැකිවන පරිදි ප්‍රසිද්ධ කිරීම වැදගත් කාර්යයක් වේ. මෙවැනි වාර්තා පුරවැසියන්ට පරිශීලනය කිරීම තුළින් අප වගවීමෙන්, පාරදෘශ්‍යභාවයකින්, ඵලදායීව හා කාර්යක්ෂමව කටයුතු කරන්නේද යන්න සම්බන්ධව තොරතුරු දැනගැනීම සඳහා වන අයිතිය තහවුරු කිරීමක් වේ.

රාජ්‍ය සේවයේ යුතුකම් හා වගකීම් ඉටුකරමින් මා හා එක්ව ජනහිතවාදී ආකර්ෂණීය සේවයක් ලබාදීමට කැපවෙන අමාත්‍යාංශ ලේකම් සහ දිස්ත්‍රික් ලේකම් ප්‍රමුඛ සමස්ථ කාර්ය මණ්ඩලයට ස්තූතිවන්ත වන අතර 2015 වසරේ ඉදිරි ඉලක්ක ජයගැනීමට එක්ව කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීමට ඔබගේ දායකත්වය අපේක්ෂා කරමි.

එම්. ජෝශප් මයිකල් පෙරේරා (පාර්ලිමේන්තු මන්ත්‍රී)
ස්වදේශ කටයුතු අමාත්‍ය

## ලේකම් තුමාගේ පණිවුඩය

**රාජ්‍ය සේවයේ යහපාලනය පෙරදැරිකරගත් හෙටක් වෙනුවෙන් ..............**



ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යනු මෙරට විශිෂ්ටතම හා සුවිශේෂී අමාත්‍යාංශයක් ලෙස හැඳින්වීම නිවැරදිය. දිවයින පුරාම විධිමත් පරිපාලනමය ව්‍යුහයකින් සහ පුළුල් ජාලයකින් සමන්විත වූ මෙම අමාත්‍යාංශය මගින් දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය සංවර්ධන කාර්ය සඳහා පුළුල් දායකත්වයක් සපයා ඇත. එසේම සංවර්ධන ක්‍රියාදාමයන්හි මහඟු ප්‍රතිඵල, බිම් මට්ටම දක්වා ගෙනයාමටද ඉවහල් වී ඇත.

2014 වර්ෂය තුළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් ඉටු කරන ලද මෙහෙවර ඇතුළත් "වාර්ෂික කාර්යසාධන හා ගිණුම් වාර්තාව" වෙත පණිවිඩයක් නිකුත් කිරීමට ලැබීම මා ලද භාග්‍යයක් ලෙස සලකමි.

පසුගිය වසර පුරාවට රාජ්‍ය අංශයේ කටයුතු විධිමත් කිරීමෙහි ලා දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් සිදුකළ සේවය අතිශයින් වැදගත්වේ. ඒ සඳහා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ පවතින දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් විශිෂ්ට දායකත්වයක් ලබාදී ඇති බව සිහිපත් කරන්නේද ස්තුති පූර්වකවය.

ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල පුළුල් ජනතා සේවයක් වෙනුවෙන් කැපවී සිටී. 21 වන ශතවර්ෂයට ගැලපෙන පරිදි ජනතා අපේක්ෂා ඉටුකිරීමෙහිලා සමීප සේවාවක් ලබාදීම සඳහා නවීන තොරතුරු තාක්ෂණය යොදාගැනීමටද දිස්ත්‍රික් ලේකම් කාර්යාල කටයුතු කර තිබේ.

මෙතෙක් ආ ගමන් මඟ තුළ අප ලත් අත්දැකීම් පෙරදැරි කරගෙන ඉදිරියටත් මහජනතාව වෙත කාර්යක්ෂමවූත්, ඵලදායීවූත් රාජ්‍ය සේවයක් ඉටු කිරීම සඳහා 2015 ජනවාරි මස සිට "ස්වදේශ කටයුතු අමාත්‍යාංශය" නමින් රටේ පරිපාලනය ව්‍යුහය යහපාලනය හා සංවර්ධනය සඳහා අප අමාත්‍යාංශයේ උපරිම දායකත්වය ලබාදීම රාජ්‍ය සේවයේ විශිෂ්ඨයන් වන ඔබගෙන් උදක්ම බලාපොරොත්තු වෙමු. ඒ රාජ්‍ය සේවයේ විශිෂ්ටත්වය පෙන්වන හෙටක් වෙනුවෙනි.

එස්.ඩී.ඒ.බී. බොරලැස්ස
ලේකම්
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

**ගාල්ල දිස්ත්‍රික් ලේකම්තුමාගේ පණිවුඩය**

**කාර්යක්ෂම හා ඵලදායී ජනතා මෙහෙවරක් උදෙසා....................**



ගාල්ල දිස්ත්‍රික්කයේ සිවිල් පරිපාලනයේ කේන්ද්‍රස්ථානය වශයෙන් සැලකෙන්නේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයයි. ග්‍රාමීය මට්ටමේ පරිපාලන කටයුතු ග්‍රාම නිලධාරී මඟින් ඉටු වන අතර ප්‍රාදේශීය මට්ටමේ පරිපාලන කටයුතු ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් සිදු කරනු ලබයි. එම සියලු කටයුතු ඒකාබද්ධ කරමින් දිස්ත්‍රික් මට්ටමේ පරිපාලන කටයුතු සිදු කරනු ලබන්නේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟිනි. මෙම සම්බන්ධීකරණ හා පරිපාලන ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම සඳහා ගාල්ල දිස්ත්‍රික්කය තුළ ග්‍රාම නිලධාරී කාර්යාල 896 ක් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 19 ක් ක්‍රියාත්මකව පවතී.

ගාල්ල දිස්ත්‍රික්කයේ 1,063,334 ක් වූ ජනගහනයෙන් 85.5% ක් ම ජීවත් වන්නේ ග්‍රාමීය අංශයේය. ඔවුන් දිස්ත්‍රික්කය තුළ ඈත ගම් නියම්ගම් දක්වා විසිරී ඇති අතර ඔවුන් බොහෝ විට ම කෘෂි කාර්මික කටයුතු ආශ්‍රිතව ජීවනෝපාය සකස් කර ගෙන ඇත. මොවුන්ගේ පමණක් නොව සමස්ථ දිස්ත්‍රික් ජනතාවගේම ආර්ථික, සමාජීය හා සංස්කෘතිකමය අවශ්‍යතාවන් මුදුන් පත් කරවීම හා ඔවුන්ගේ ගැටළු වලට විසඳුම් ලබා දෙමින් ජනතා අපේක්ෂාවන් යථාර්ථයක් බවට පත් කර ලීම අපගේ ඒකායන ප්‍රාර්ථනය වේ.

දිස්ත්‍රික්කය තුළ ජනතාවගේ යටිතල පහසුකම් නංවාලීම සඳහා එක ගමකට එක වැඩක්, ගම නැඟුම වැඩසටහන, ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන, ග්‍රාමීය පාසල් සංවර්ධනය, මහජන නියෝජිත විශේෂ ව්‍යාපෘති, විමධ්‍යගත වැඩසටහන, දිවි නැඟුම වැඩසටහන, පළාත් මාර්ග කාපට් ව්‍යාපෘතිය, රුහුණු උදානය වැනි වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරනු ලබයි. තවද අඩු ආදායම්ලාභී ජනතාව සවිබල ගැන්වීම සඳහා සමෘද්ධි සහනාධාර, පෝෂණ සහනාධාර, ප්‍රජා මූලික පුනරුත්ථාපන වැඩසටහන (CBR), ආබාධිත පුද්ගලයන් සඳහා ආධාර ලබා දීම වැනි වැඩසටහන් ද ක්‍රියාත්මක කරනු ලබයි.

නවීන තාක්ෂණික උපක්‍රම ඔස්සේ පොදු ජන අවශ්‍යතාවයන් ඉතාම ඉක්මනින් ඉටු කර දීම සඳහා මාගේ කාර්ය මණ්ඩලය ඉමහත් කැපවීමකින් කටයුතු කරන අතර ඉදිරියේදී ද ගාල්ල දිස්ත්‍රික්කයේ ජනතාවගේ දරිද්‍රතා මට්ටම අවම කරමින් ඔවුන්ගේ අවශ්‍යතාවයන් උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව ඉටු කිරීම සඳහා කටයුතු කරන අතර ඒ සඳහා ඉමහත් ධෛර්යයකින් යුතුව කටයුතු කරන මාගේ ග්‍රාම නිලධාරීන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන් සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සියලුම නිලධාරීන්ට මාගේ ගෞරවනීය ස්තූතිය පිරිනමමි.

රවීන්ද්‍ර හේවාවිතාරණ
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කය

# 1. ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හැඳින්වීම

ගාල්ල දිස්ත්‍රික්කයේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාල 19 හි ප්‍රාදේශීය පරිපාලන කටයුතු සම්බන්ධීකරණය කිරීමේ කේන්ද්‍රස්ථානය වන්නේ ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයයි. දකුණු පළාතේ අග නගරය වන ගාල්ල නගරය වර්තමානය වන විට ඉතා ජනප්‍රිය මෙන්ම ජනාකීර්ණ නගරයක් බවට පත් ව ඇති අතර වේගයෙන් සංවර්ධනය වන නගරයකි. 1,063,334 ක් වන ජනගහනයක් මෙහි ජීවත් වන අතර ඔවුන් ගේ ආර්ථික , සමාජීය හා සංස්කෘතික අවශ්‍යතාවයන් හඳුනා ගෙන ඒවා සඳහා විසඳුම් ලබා දීමේ සම්බන්ධීකරණ වැඩ පිළිවෙල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් ඉටු කරනු ලබයි.

රාජ්‍ය අංශයේ මෙන්ම පෞද්ගලික අංශයේ සේවා සපයන ආයතන සහ නිෂ්පාදන ආයතන ලෙස කටයුතු කරන සුවිසල් ගොඩනැඟිලි රාශියක් මධ්‍යයේ ගාල්ල දිස්ත්‍රික්කයේ හදවත බඳු වූ ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ගාල්ල නගරය අරා විරාජමාන වී සිටී. ගාල්ල කොළඹ ප්‍රධාන මාර්ගයේ ගාල්ල ප්‍රධාන බස් නැවතුම්පොළට හා ගාල්ල ප්‍රධාන දුම්රිය ස්ථානයට සමීපාසන්නවම නවීන පන්නයේ සත් මහල් ප්‍රාසාදයක මෙම කාර්යාලය ස්ථාන ගත කර ඇත. මහජනතාවට තම සේවා අවශ්‍යතාවයන් සැණින් සපුරා ගත හැකි ලෙස ඉතා පහසුවෙන් ප්‍රවේශ විය හැකි ස්ථානයක් මෙන්ම නවීන තාක්ෂණය අනුව කටයුතු කරමින් ඉක්මණින් මහජන අවශ්‍යතාවයන් සපුරාදෙන ඉතා සුව පහසු දැකුම්කළු සේවා ආයතනයක් ලෙසද මෙය හැඳින්විය හැකිය. මහජනතාවට සඵලදායී කාර්යක්ෂම සේවාවන් රැසක් එකම වහළක් යටින් ලබා දීමේ ඒකායන අරමුණින් මධ්‍යම රජයේ සහ පළාත් රාජ්‍ය සේවයේ ආයතන රාශියක් මෙම දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රය තුළ ස්ථාන ගත කර ඇත.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය තුළින් මහජනතාවට ලබා දෙන සේවාවන් සහ එම සේවාව ලබා දීමට ගත වන කාලය සඳහන් කරමින් සකසන ලද සේවාලාභී ප්‍රඥප්තිය කාර්යාල පරිශ්‍රයේ බිම් මහලේ ප්‍රදර්ශනය කර ඇත. නූතන පරිගණක තාක්ෂණය භාවිතා කරමින් වේගයෙන් කටයුතු කරන බැවින් සෑම නිළධාරියෙක්ම එම ප්‍රඥප්තියෙහි සඳහන් කාල පරාසය තුල ම තම සේවාව ඉටු කර දීමට බොහෝ සෙයින් උත්සුක වේ.

ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වර්තමාන දිස්ත්‍රික් ලේකම් ලෙස කටයුතු කරනු ලබන්නේ රවීන්ද්‍ර හේවාවිතාරණ මැතිතුමාය. 1948 ආරම්භයේ සිට මේ දක්වා ආණ්ඩුවේ ඒජන්තවරුන් / දිසාපතිවරුන් / දිස්ත්‍රික් ලේකම්වරුන් 23 ක් මෙහි කටයුතු කර ඇති අතර 2012 වර්ෂයේ සිට වත්මන් දිස්ත්‍රික් ලේකම් රවීන්ද්‍ර හේවාවිතාරණ මහතා කටයුතු කරනු ලබයි.

**1.1** **දැක්ම :-**

ගාල්ල දිස්ත්‍රික්කයේ
ජනතාව සඳහා
විශිෂ්ට රාජ්‍ය සේවාවක්
ලබා දීම.

**මෙහෙවර :-**

නිපුනතාවයෙන් හෙබි
මානව සම්පත් උපයෝජනය සහිත
දිස්ත්‍රික් මට්ටමේ
උසස් පරිපාලන ක්‍රමයක් තුළින්
විශිෂ්ට රාජ්‍ය සේවාවක් තහවුරු කිරීම.

## 1. 2 අරමුණු :-

1. දිස්ත්‍රික්කය තුල ක්‍රියාත්මක වන විවිධ දෙපාර්තමේන්තු , සංස්ථා , මණ්ඩල හා අධිකාරීන් මඟින් ක්‍රියාත්මක කරනු ලබන දේශීය හා විදේශීය අරමුදල් මඟින් ක්‍රියාත්මක වන ව්‍යාපෘති හා වැඩ සටහන් සංවිධානය කිරීම, මූල්‍යමය සහ මූල්‍යමය නොවන සම්පත් යෙදවීම සහ පසු විපරම් කටයුතු වල සම්බන්ධීකාරකයා ලෙස ක්‍රියා කරමින් දිස්ත්‍රික්කයේ ජනතාවගේ සුභ සාධනය සහ සංවර්ධනය ඉහළ නැංවීම.

2. කාර්යක්ෂම හා ඵලදායී දිස්ත්‍රික් පරිපාලන පද්ධතියක් පවත්වාගෙන යාම තුලින් දිස්ත්‍රික් බල ප්‍රදේශය තුල වෙසෙන ජනතාවගේ විවිධ වූ ආර්ථික, සමාජ හා සංස්කෘතිකමය අවශ්‍යතාවයන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඔස්සේ ඉටු කර දීම.

3. දිස්ත්‍රික්කයේ රජයේ නියෝජිතයා වශයෙන් ක්‍රියා කරමින් විවිධ අමාත්‍යාංශ , දෙපාර්තමේන්තු , ආයතන සහ රාජ්‍ය නොවන සංවිධාන වලට නිවැරදි තීරණ ගැනීම සඳහා අවශ්‍ය නිවැරදි සහ නිශ්චිත තොරතුරු ග්‍රාමීය හා ප්‍රාදේශීය මට්ටමින් එක් රැස් කර ඒකාබද්ධ කර සපයා දීම.

4. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඔස්සේ රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙනුවෙන් දිස්ත්‍රික්කය තුල ඔවුන්ට හිමි ආදායම් එක් රැස් කිරීම, ගිණුම් ගත කිරීම, භාණ්ඩාගාරය වෙත නිවේදනය කිරීම.

5. ගංවතුර, සුළි සුළං, නියඟ, මුහුද ගොඩ ගැලීම් වැනි විස්තීර්ණ ආපදා අවස්ථා වල දී ජනතාවට අවශ්‍ය ක්ෂණික සහන සේවාවන් සහ ආධාර ලබා දී ඔවුන්ගේ ජීවන තත්වය යථා තත්වයට පත් කිරීම.

## 1.3 කාර්යයන් :-

1. ජාතික මට්ටමේ හා දිස්ත්‍රික් මට්ටමේ සංස්කෘතික, ආගමික හා වෙනත් කාලීන රාජ්‍ය උත්සව සංවිධානය කිරීමේ ප්‍රධානියා ලෙස ක්‍රියා කිරීම.

2. සියළුම මැතිවරණ කටයුතු එනම් ජනාධිපතිවරණය, පාර්ලිමේන්තු මැතිවරණය, පළාත් සභා මැතිවරණය හා පළාත් පාලන මැතිවරණ වල දී මැතිවරණ කොමසාරිස්ගේ නියෝජිතයා වශයෙන් දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරී ලෙස ක්‍රියා කරමින් සාධාරණ හා අපක්ෂපාතී මැතිවරණ පැවැත්වීමට ක්‍රියා කිරීම.

3. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව, දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේ ලේකම් වශයෙන් ක්‍රියා කරමින් දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතු සැලසුම් කිරීම, සංවිධානය කිරීම, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම.

4. දිස්ත්‍රික්කය තුල ප්‍රාදේශීය ලේකම්වරුන් 19 දෙනා සමඟ ප්‍රාදේශීය පරිපාලන කටයුතු මෙහෙයවීමේ ප්‍රධානියා ලෙස ක්‍රියා කිරීම.

5. විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සම්බන්ධ ආදායම් ගණන් දීමේ නිලධාරීන් වෙනුවෙන් ඔවුන්ගේ ආදායම් එක් රැස් කිරීම, ගිණුම් ගත කිරීම, භාණ්ඩාගාරයට වාර්තා කිරීම හා අදාල ආදායම් ගණන් දීමේ නිලධාරීන් දැනුවත් කිරීම.

6. දිස්ත්‍රික් බල ප්‍රදේශය තුල සියළුම රාජ්‍ය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වල නියෝජ්‍ය ප්‍රධානියා ලෙස ක්‍රියා කරමින් ඒ ඒ දෙපාර්තමේන්තු වල අරමුණු , පරමාර්ථ හා කාර්යයන් ඉටු වන පරිදි සම්බන්ධීකරණ කටයුතු කිරීම.

7. නියඟ, ගං වතුර, සුළි සුළං, මුහුද ගොඩ ගැලීම් වැනි විස්තීර්ණ ආපදා අවස්ථාවන්හිදි රජයේ නියෝජිතයා ලෙස ක්‍රියා කරමින් ආපදා කළමනාකරණ කටයුතු සංවිධානය කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය හා පසු විපරම් කටයුතු කිරීම තුලින් ජන ජීවිතය යථා තත්වයට පත් කිරීම හා ස්ථාවර කිරීම.

8. දිස්ත්‍රික්කය තුළ ඉඩම් ඔප්පු, උප්පැන්න, මරණ සහ විවාහ ලියාපදිංචි කිරීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීම.

9. දිස්ත්‍රික්කය තුළ විශ්‍රාම වැටුප් වැඩ සටහන සම්බන්ධීකරණය කිරීම.

## 1.4 දිස්ත්‍රික් ලේකම් අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන අනුබද්ධිත කාර්යාල

1. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
2. දිස්ත්‍රික් ක්‍රම සම්පාදන ලේකම් කාර්යාලය
3. දිස්ත්‍රික් දිවි නැගුම කාර්යාලය
4. සහකාර මැතිවරණ කොමසාරිස් කාර්යාලය
5. කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය
6. දිස්ත්‍රික් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් කාර්යාලය
7. කිරුම් මිණුම් හා ප්‍රමිති සේවා කාර්යාලය
8. දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන කාර්යාලය
9. දිස්ත්‍රික් ක්‍රීඩා අංශය
10. මාධ්‍ය හා ප්‍රවෘත්ති අංශය
11. ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය
12. පාරිභෝගික සේවා අධිකාරිය
13. දිස්ත්‍රික් කෘෂි කර්ම කාර්යාලය
14. වෘත්තීය මාර්ගෝපදේශ අංශය
15. ඵලදායීතා ප්‍රවර්ධන අංශය
16. ආපදා කළමනාකරණ අංශය
17. පරිසර අංශය
18. ද්වි භාෂා සහන කවුළුව
19. පුපුරණ ද්‍රව්‍ය අංශය
20. දිස්ත්‍රික් සංස්කෘතික අංශය
21. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ගාල්ල කඩවත් සතර
22. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - තවලම
23. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - නියාගම
24. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - අම්බලන්ගොඩ
25. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කරන්දෙණිය
26. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ඇල්පිටිය
27. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - නෙළුව
28. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - නාගොඩ
29. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - බලපිටිය
30. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - හික්කඩුව
31. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - අක්මීමණ
32. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - බෙන්තොට
33. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - හබරාදූව
34. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - බද්දේගම
35. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - යක්කලමුල්ල
36. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - බෝපෙ පෝද්දල
37. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - වැලිවිටිය දිවිතුර
38. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ඉමදූව
39. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ගෝනපීනුවල

# 02. ගාල්ල දිස්ත්‍රික්කය හැඳින්වීම

දකුණු පළාතේ අග නගරය ලෙස හැඳින්වෙන ගාල්ල දිස්ත්‍රික්කය උතුරින් කළුතර හා රත්නපුර දිස්ත්‍රික්ක වලින් ද නැගෙනහිරින් මාතර දිස්ත්‍රික්කයෙන්ද බටහිරින් ඉන්දියන් සාගරයෙන්ද මායිම් වන පරිදි වර්ග කි.මී.1651.6 ක භූමි ප්‍රදේශයක් පුරා විහිදී ඇත. මින් ගොඩ බිම් ප්‍රමාණය වර්ග කි.මී.1635.6 ක් වන අතර වර්ග කි.මී. 16 ක් අභ්‍යන්තර ජලාශ වලින් නිර්මාණය වී ඇත. උතුරු අක්ෂාංශ අංශක 5.97 – 6.44 ක් නැගෙනහිර දේශාංශ අංශක 79.99 – 80.49 අතර ගාල්ල දිස්ත්‍රික්කය පිහිටා ඇත.

ගාල්ල දිස්ත්‍රික්කය ශ්‍රී ලංකාවේ නිරිත දිග ප්‍රදේශයට අයත් වුවද, භූ විෂමතාවය හා වර්ෂාපතනය අනුව පහත රට තෙත් කලාපයට අයත් වේ . වාර්ෂික වර්ෂාපතනය අඟල් 80 – 160 වන අතර , සාමාන්‍ය වාර්ෂික උෂ්ණත්වය 75 $F^0$ ක් පමණ වේ. වසරේ මැයි සිට සැප්තැම්බර් දක්වා නිරිත දිග මෝසම් වැස්ස මගින් අධික වර්ෂාපතනයක් දක්නට ලැබේ. මෙයට අමතරව සංවහන හා වාසුළි මගින් ද වැසි ලැබේ.

ගාල්ල දිස්ත්‍රික්කයට අයත් ප්‍රධාන ගංගාව ගිං ගඟ වේ. මීට අමතරව බෙන්තොට ගඟ ,මාදු ගඟ, කොග්ගල ඔය වැනි කුඩා ගංගා ද දැකිය හැකිය. මෙහි ඇති ප්‍රධාන කඳු ලෙස කබරගල කන්ද, කොන්දගල කන්ද, කැකිරිහේන කන්ද, වාඩියහේන කන්ද, හිනිදුම කන්ද, තිබ්බොටුවාව කන්ද හා බලගල යනාදී කඳු පෙන්වා දිය හැකිය. ස්වභාව ධර්මයේ අපූර්ව නිර්මාණ වන කඩොලාන ශාක වලින් යුත් වගුරු බිම් හා කළපු වෙරළාසන්න කලාපය පුරාම දැකිය හැකිය.

දකුණු පළාතේ අග නගරය වන ගාල්ල නගරය ඉතා පෞරාණික එමෙන්ම ඓතිහාසික නගරයකි. ශ්‍රී ලාංකීය සාහිත්‍ය කලාවේ ස්වර්ණමය යුගය වශයෙන් සැලකෙන කෝට්ටේ යුගයේ රචිත, මයුර, තිසර, පරෙවි, කෝකිල ආදී සංදේශ කාව්‍ය කිහිපයකම ගාල්ල නගරය අතිශය වර්ණනාවට පාත්‍ර කර තිබීමෙන් පෙනී යන්නේ මෙය ඓතිහාසික වශයෙන් පමණක් නොව සාහිත්‍ය වශයෙන්ද අනගි නගරයක් බවයි. ඈත අතීතයේ ගාල්ල නගරය විදේශිකයන් අතර පවා ප්‍රසිද්ධියට පත්වූයේ මෙහි ඇති ස්වභාවික වරාය නිසාවෙනි. ක්‍රි. ව. 1587 දී පෘතුගීසින් විසින් ගාල්ල නගරය අත්පත් කර ගත් අතර ක්‍රි. ව. 1619 දී තාප්පයක් බඳවා ඇත .ඉන් පසු ලන්දේසී විසින් ගාල්ල අත්පත් කර ගැනීමෙන් පසු ගාල්ල කොටුව විශාල කරනු ලැබීය.

දෙස් විදෙස් සංචාරකයින්ට දැක බලා රස විඳිය හැකි විශේෂ ස්ථාන රාශියක් ම ගාල්ල දිස්ත්‍රික්කය පුරා විසිරී ඇත. ලන්දෙසී බලකොටුව හා කොටු පවුර , රූමස්සල කඳු වැටිය , සිංහරාජ වනාන්තරය හා දූවිලි ඇල්ල ,මාදු ගඟ ආශ්‍රිත කුඩා දූපත් , මඩොල්දූව සහ මාර්ටින් වික්‍රමසිංහ කෞතුකාගාරය , සීනිගම හා වැල්ලේ දේවාල පුද බිම්, ගාල්ල ප්‍රදීපාගාරය හා සමුද්‍ර කෞතුකාගාරය ආදීය දැක්විය හැක.

ශ්‍රී ලංකාවේ ජාතික ආදායමට ගාල්ල දිස්ත්‍රික්කයෙන් සැලකිය යුතු දායකත්වයක් ලබා දේ. එය කෘෂිකාර්මික, කර්මාන්ත හා සංචාරක යන ක්ෂේත්‍රයන්ගෙන් සපයනු ලැබේ. කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ වී, තේ, රබර්, පොල්, කුරුඳු වැනි භෝග ප්‍රධාන තැනක් ගනී.

## ගාල්ල දිස්ත්‍රික් කෘෂිකාර්මික භෝග වගාව (හෙක්ටයාර වලින්)

| | |
|---|---|
| වී (යල කන්නය) | 10,495.30 |
| තේ | 27,427.00 |
| රබර් | 6,679.30 |
| පොල් | 12,548.00 |
| කුරුඳු | 12,110.00 |
| කෝපි | 12,134.00 |
| ගම්මිරිස් | 1,019.90 |
| කජු | 75.03 |
| කරාබු | 60.36 |
| බුලත් | 239.52 |




ගාලු නගරයට කි.මී.10 ක් පමණ දුරින් කොග්ගල නිදහස් වෙළඳ කලාපය පිහිටා ඇති අතර ඉන් විශාල පිරිසකට රැකියා පහසුකම් සැලසී ඇත. පාරම්පරික නිර්මාණ අතර බීරළු රේන්ද, කැටයම් කලාව (අලි කැපීම) , වෙස් මුහුණු සහ රුකඩ ගාල්ල දිස්ත්‍රික්කයට ආවේනික කර්මාන්ත වේ.

ගාල්ල කොළඹ අධිවේගී මාර්ගය නිසා රටේ සමස්ථ ජාතික ආර්ථික සංවර්ධනයට ගාල්ල දිස්ත්‍රික්කයේ දායකත්වය තවත් වැඩි දියුණු කිරීමට හේතු වී ඇත. එමෙන්ම සංචාරක ව්‍යාපාරයට සහ ගාල්ල වරාය කටයුතු වලටද මෙය විශාල පිටු බලයක් වී ඇත.

ගාල්ල දිස්ත්‍රික්කයේ වාරි මාර්ග පද්ධතිය වැව් 04 කින් අමුණු 504 කින් සහ ප්‍රධාන නල මාර්ග 117 කින් සමන්විත වී ඇත. මෙම වාරි මාර්ග පද්ධතිය පාලනය කිරීම හා නඩත්තු කිරීම සිදු කරනු ලබන්නේ ප්‍රධාන රාජ්‍ය ආයතන 03 ක මැදිහත් වීමෙනි.

1. මධ්‍යම රජයේ වාරි මාර්ග දෙපාර්තමේන්තුව
2. පළාත් වාරි මාර්ග දෙපාර්තමේන්තුව
3. ගොවි ජන සේවා දෙපාර්තමේන්තුව

1,063,334 ක් වන ගාල්ල දිස්ත්‍රික්කයේ ජනගහනයෙන් වැඩි ප්‍රමාණයක් ජීවත් වන්නේ ග්‍රාමීය අංශයේය. එය 85.68% ක් පමණ වේ. එමෙන්ම ගාල්ල දිස්ත්‍රික්කයේ කාන්තා ජනගහනය වැඩි මට්ටමක පවතින අතර එය 52% ක් පමණ වේ.

අංශ හා ස්ත්‍රී, පුරුෂ භාවය අනුව ගාල්ල දිස්ත්‍රික්කයේ ජනගහනය

| අංශය | මුළු ජනගහනය | පුරුෂ | ස්ත්‍රී |
|---|---|---|---|
| නාගරික | 133,398 | 63,778 | 69,620 |
| ග්‍රාමීය | 911,159 | 437,019 | 474,140 |
| වතු | 18,777 | 9,105 | 9,672 |
| එකතුව | 1,063,334 | 509,902 | 553,432 |

1,063,334 ක් වන ගාල්ල ජනගහනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ අනුව ස්ත්‍රී පුරුෂ අනුව බෙදී ඇති ආකාරය පහත සඳහන් පරිදි දැක්විය හැක. (2012 ජනගහනය අනුව).

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | පුරුෂ | | ස්ත්‍රී | | එකතුව | | පුමිතිරි අනුපාතය |
|---|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | |
| බෙන්තොට | 24,084 | 48.19 | 25,891 | 51.81 | 49,975 | 100.00 | 93.02 |
| බලපිටිය | 31,977 | 47.42 | 35,455 | 52.58 | 67,432 | 100.00 | 90.19 |
| කරන්දෙණිය | 30,175 | 48.28 | 32,323 | 51.72 | 62,498 | 100.00 | 93.35 |
| ඇල්පිටිය | 31,068 | 48.00 | 33,658 | 52.00 | 64,726 | 100.00 | 92.30 |
| නියාගම | 17,279 | 48.57 | 18,295 | 51.43 | 35,574 | 100.00 | 94.45 |
| තවලම | 15,957 | 48.93 | 16,652 | 51.07 | 32,609 | 100.00 | 95.83 |
| නෙළුව | 14,394 | 50.26 | 14,246 | 49.74 | 28,640 | 100.00 | 101.04 |
| නාගොඩ | 25,936 | 48.18 | 27,893 | 51.82 | 53,829 | 100.00 | 92.98 |
| බද්දේගම | 35,757 | 47.67 | 39,251 | 52.33 | 75,008 | 100.00 | 91.10 |
| වැලිවිටිය | 13,988 | 47.66 | 15,359 | 52.34 | 29,347 | 100.00 | 91.07 |
| අම්බලන්ගොඩ | 27,302 | 47.93 | 29,659 | 52.07 | 56,961 | 100.00 | 92.05 |
| හික්කඩුව | 49,104 | 48.18 | 52,805 | 51.82 | 101,909 | 100.00 | 92.99 |
| කඩවත් සතර | 48,796 | 47.96 | 52,953 | 52.04 | 101,749 | 100.00 | 92.15 |
| බෝපේ පෝද්දල | 23,863 | 47.41 | 26,468 | 52.59 | 50,331 | 100.00 | 90.16 |
| අක්මීමන | 36,906 | 47.45 | 40,870 | 52.55 | 77,776 | 100.00 | 90.30 |
| යක්කලමුල්ල | 22173 | 47.26 | 23,773 | 51.74 | 45,946 | 100.00 | 93.27 |
| ඉමදුව | 27,289 | 47.44 | 23,591 | 52.56 | 44,880 | 100.00 | 90.24 |
| හබරාදූව | 29,593 | 47.43 | 32,796 | 52.57 | 62,389 | 100.00 | 90.23 |
| ගෝනාපිනුවල | 10,261 | 47.17 | 11,494 | 52.83 | 21,755 | 100.00 | 89.27 |
| එකතුව | 509,902 | 47.95 | 553,432 | 52.05 | 1,063,334 | | 92.13 |

ගාල්ල දිස්ත්‍රික්කයේ ජන ඝණත්වය (හෙක්ටයාර 1 කට පුද්ගල සංඛ්‍යාව) 644 කි. අඩුම ජන ඝණත්වය වාර්තා වන්නේ තවලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් වන අතර එය 183 කි. වැඩිම ජන ඝණත්වය 4239 ක් වන අතර එය වාර්තා වන්නේ කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් වේ.

| මාසය | වර්ෂාපතනය (මි.මී.) | ආර්ද්‍රතාවය% | | උෂ්ණත්වය (සෙ.අං) | |
|---|---|---|---|---|---|
| | | දිවා | රාත්‍රී | උපරිම | අවම |
| ජනවාරි | 64.6 | 79 | 88 | 29.9 | 23.6 |
| පෙබරවාරි | 37.7 | 79 | 89 | 30.4 | 24.3 |
| මාර්තු | 114.1 | 78 | 90 | 31.6 | 24.8 |
| අප්‍රේල් | 24.4 | 76 | 86 | 31.8 | 26.3 |
| මැයි | 182.3 | 84 | 88 | 30.1 | 26.1 |
| ජුනි | 232.7 | 86 | 90 | 28.9 | 25.0 |
| ජූලි | 207.7 | 85 | 90 | 28.7 | 25.0 |
| අගෝස්තු | 33.8 | 85 | 90 | 28.5 | 25.2 |
| සැප්තැම්බර් | 230.4 | 84 | 88 | 28.9 | 25.1 |
| ඔක්තෝබර් | 291.6 | 83 | 89 | 29.1 | 25.1 |
| නොවැම්බර් | 286.6 | 79 | 90 | 30.2 | 24.2 |
| දෙසැම්බර් | 93.2 | 81 | 89 | 29.3 | 23.9 |






8000 0 8000 16000

## දිස්ත්‍රික්කයේ මූලික සංඛ්‍යාලේඛන තොරතුරු - (2014)

- දිස්ත්‍රික්කයේ නම : ගාල්ල දිස්ත්‍රික්කය
- පළාත : දකුණු පළාත
- මුළු භූමි ප්‍රමාණය : වර්ග කිලෝ මීටර් 1652
- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ගණන : 19
- ග්‍රාම නිළධාරී කොට්ඨාශ ගණන : 896
- ගම්මාන සංඛ්‍යාව : 2,446
- මුළු ඡන්ද හිමියන් ගණන : 819,666
- ඡන්ද කොට්ඨාශ ගණන : 703
- මහ නගර සභා ගණන : 01
- නගර සභා ගණන : 02
- ප්‍රාදේශීය සභා ගණන : 17
- සංචාරක නිවාස ගණන (ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති) : 02
- රජයේ නිවාස ගණන (ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති) : 61
- කලාප අධ්‍යාපන කාර්යාල ගණන : 04

| කලාප අධ්‍යාපන කාර්යාල | පාසැල් සංඛ්‍යාව | | | ගුරුවරු සංඛ්‍යාව | විදුහල්පතිවරු සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|
| | ජාතික | පළාත් සභා | මුළු ගණන | | ස්ථිර | වැඩ බලන |
| 1. ගාල්ල | 17 | 130 | 147 | 4,901 | 125 | 22 |
| 2. අම්බලන්ගොඩ | 5 | 78 | 83 | 2,062 | 58 | 25 |
| 3. ඇල්පිටිය | 3 | 120 | 123 | 2,414 | 81 | 42 |
| 4. උඩුගම | 3 | 75 | 78 | 1,577 | 47 | 31 |

- පාසැල් ගණන : 431
- ගුරුවරු ගණන : 10,954
- පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ගණන : 10
- පළාත් සභා මන්ත්‍රීවරු ගණන : 22
- පළාත් පාලන ආයතන ගණන : 20
- පළාත් පාලන ආයතන සභිකයන් ගණන : 244
- දිස්ත්‍රික්කයේ ජනගහනය (2012 වර්ෂයේ සංගණනයට අනුව) : 1,063,334

## 03. සංවිධාන ව්‍යුහය.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අරමුණු මුදුන් පමුණුවා ගත හැකි ආකාරයට වගකීම් හා කාර්යයන් නිසි අයුරින් ඉටු කිරීමට හැකි වන පරිදි 261 වැය ශීර්ෂය යටතේ මෙහෙයුම් වැඩසටහන ක්‍රියාත්මක වේ. එය ව්‍යාපෘති 2 කින් යුක්ත වේ.

ව්‍යාපෘතිය 1 - සාමාන්‍ය පරිපාලනය හා ආයතන සේවා - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය.

ව්‍යාපෘතිය 2 - ප්‍රාදේශීය ලේකම් කාර්යාල

## 3.1 සංවිධාන සටහන

දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය සංවිධාන සටහන සකස් කිරීමේ දී 261 ගාල්ල දිස්ත්‍රික් ලේකම්ගේ වැය ශීර්ෂයෙන් වැටුප් ලබන කාර්ය මණ්ඩලය පමණක් නොව දිස්ත්‍රික් ලේකම්ගේ අධීක්ෂණය යටතේ ඇති වෙනත් දෙපාර්තමේන්තු හා රේඛීය අමාත්‍යාංශ වල කාර්ය මණ්ඩලය ද ඇතුලත් කර ඇත.

# සංවිධාන සටහන - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ගාල්ල



**කාර්ය මණ්ඩල විස්තර**

ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඊට අනුබද්ධ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 19 හි අනුමත කාර්ය මණ්ඩලය, දැනට සේවයේ නියුක්ත කාර්ය මණ්ඩලය පහත සඳහන් පරිදිය.

| කාණ්ඩය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | | ප්‍රාදේශිය ලේකම් කාර්යාල | |
|---|---|---|---|---|
| | අනුමත සේවක සංඛ්‍යාව | සත්‍ය සේවක සංඛ්‍යාව | අනුමත සේවක සංඛ්‍යාව | සත්‍ය සේවක සංඛ්‍යාව |
| ජ්‍යෝෂ්ඨ මට්ටම - ස්ථිර | 8 | 8 | 60 | 56 |
| තෘතීය මට්ටම - ස්ථිර | 1 | 1 | 38 | 21 |
| ද්විතීය මට්ටම - ස්ථිර | 79 | 77 | 1,543 | 1,494 |
| ප්‍රාථමික මට්ටම - ස්ථිර ආදේශක | 17 | 18 | 158 | 155 |
| එකතුව | 105 | 104 | 1,799 | 1,726 |

## 04. දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සාමාන්‍ය පරිපාලනය

### 4.1 2014 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට සමගාමීව කරන ලද කාර්යයන්

### 4.1.1. ව්‍යාපෘති අනුව ප්‍රතිපාදන හා සත්‍ය වියදම

2014 වර්ෂය සඳහා ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට හා ඒ යටතේ ක්‍රියාත්මක වන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 19 සඳහා ලැබී ඇති මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මි. 936.375 කි. මෙයින් ව්‍යාපෘති 01 සඳහා රු.මි.171.90 ක් සහ ව්‍යාපෘති 02 සඳහා රු.මි.764.475 ක් ද වෙන් කර ඇත. ව්‍යාපෘති 01 සහ 02 හි වියදම වෙන් වෙන් වශයෙන් පහත සඳහන් පරිදිය.

**පුනරාවර්තන වියදමේ සංයුතිය - 2014 වර්ෂය ව්‍යාපෘතිය 01**
**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ගාල්ල**

| වැය විස්තරය | සත්‍ය වියදම රු. |
|---|---|
| පුද්ගල පඩිනඩි | 101,191,564 |
| ගමන් වියදම් | 606,014 |
| සැපයීම් | 3,968,841 |
| නඩත්තු වියදම් | 3,896,418 |
| සේවා | 13,296,322 |
| මාරු කිරීම් | 2,181,987 |
| එකතුව | **125,141,146** |



# <u>ප්‍රාග්ධන වියදමේ සංයුතිය - 2014 වර්ෂය</u>
## <u>දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල</u>

| වැය විස්තරය | සත්‍ය වියදම රු. |
|---|---|
| මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම | 8,670,289 |
| මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 35,166,392 |
| පුහුණු කිරීම හා හැකියා වර්ධනය | 1,780,905 |
| එකතුව | 45,617,586 |




ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 19 හි ගොඩනැගිලි නඩත්තු සඳහා වැය විෂය 261-1-1-0-2001 යටතේ ලැබී තිබූ ශුද්ධ ප්‍රතිපාදනය රු.5,250,000.00 කි. 2014 ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කරමින් 2 වන කාර්තුව වන විට 13% ක ද 3 වන කාර්තුව වන විට 29% ක ප්‍රගතියක් ද ලබා ගත් අතර අවසාන කාර්තුව වන විට 99% ක මූල්‍ය ප්‍රගතියක් ලබා ගෙන ඇත.

වැය ශීර්ෂ 261-1-1-0-2002 යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ අළුත්වැඩියා සඳහා රු.1,750,000.00 ක ප්‍රතිපාදනයක් ලැබී තිබුනි. 2014 ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කරමින් 2 වන කාර්තුව වන විට 20% ක ද 3 වන කාර්තුව වන විට 40% ක ද ප්‍රගතියක් හිමි කර ගෙන තිබූ අතර 4 වන කාර්තුව වන විට 98 % ක මූල්‍ය ප්‍රගතියක් අත් කර ගැනීමට සමත් වී ඇත.

වැය ශීර්ෂ 261-1-1-0-2003 වැය ශීර්ෂය යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල වාහන සඳහා 2014 වර්ෂයට රු.1,750,000.00 ක ප්‍රතිපාදන වෙන් කර තිබූ අතර ක්‍රියාකාරී සැලැස්මට අනුව 1 වන කාර්තුවේ දී 5% ක් ද 2 වන කාර්තුව වන විට 25% ක් ද 3 වන කාර්තුව වන විට 90% ක් හා 4 වන කාර්තුව වන විට 100% ක් වැය කිරීමට සැලසුම් කර තිබුනද දෙවන කාර්තුව වන විට 27% ක ද තුන්වන කාර්තුව වන විට 70% ක ද ප්‍රගතියක් හිමි කර ගනිමින් හතරවන කාර්තුව වන විට 99 % ක මූල්‍ය ප්‍රගතියක් ලබා ගෙන ඇත.

වැය ශීර්ෂ 261-1-1-0-2102 ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ සඳහා රු. 5,500,000.00 ක ප්‍රතිපාදන ලැබී තිබුනි. 2014 ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කරමින් දෙවන කාර්තුව වන විට 25% කුත් , තුන්වන කාර්තුව වන විට 69.7 කුත් හතරවන කාර්තුව වන විට 98.9% කුත් වැය කරමින් වර්ෂය අවසානයේදී 99% ක මූල්‍ය ප්‍රගතියක් අත් කර ගෙන ඇත.

වැය ශීර්ෂ 261-1-1-0-2103 යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ අත් පත් කර ගැනීම් සඳහා ලැබී තිබූ ශුද්ධ ප්‍රතිපාදනය රු. 1,750,000.00 කි. 2014 ක්‍රියාකාරී සැලැස්ම අනුව කටයුතු කරමින් 2 වන

කාර්තුව වන විට 5.8% කුත් ,තුන්වන කාර්තුව වන විට 21% ක් වැය කරමින් වර්ෂය අවසානෙය්දී 99.99% ක මූල්‍ය ප්‍රගතියක් ලබා ඇත.

වැය ශීර්ෂ 261-1-1-0-2104 ගොඩනැගිලි සහ ඉදි කිරිම් සඳහා ශුද්ධ ප්‍රතිපාදනය රු. 38,000,000.00 කි. 3 වන කාර්තුව වන විට 12.69% ක් ද 4 වන කාර්තුව වන විට 99.99% ක් වැය කරමින් වර්ෂ අවසානයේදී 99.99% ක මූල්‍ය ප්‍රගතියක් ලබා ඇත.

වැය ශීර්ෂ 261-1-1-0-2401 දැනුම වර්ධනය හා ආයතනික සංවර්ධනය සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය කාර්ය මණ්ඩලය සඳහා රු.800,000.00 ක ශුද්ධ ප්‍රතිපාදනයක් ලැබී ඇත. 2014 ක්‍රියාකාරී සැලැස්මට අනුව සැලසුම් කර තිබුනේ පළමු කාර්තුව තුළ 10% ක් ද 2 වන කාර්තුව වන විට 50% ක් ද 3 වන කාර්තුව වන විට 80% ක් හා 4 වන කාර්තුව වන විට 100% ක් වැය කිරීමටයි. සත්‍ය වියදම අනුව බලන විට තුන්වන කාර්තුව වන විට 16.76% ක් හා හතරවන කාර්තුව වන විට 99.99% ක් වැය කරමින් 2014 වර්ෂය අවසානයේ 99.99% ක මූල්‍ය ප්‍රගතියක් හිමි කරගෙන ඇත.

වැය ශීර්ෂ 261-1-2-0-2401 ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය කාර්ය මණ්ඩලයේ දැනුම වර්ධනය හා ආයතනික සංවර්ධනය සඳහා රු. 1,000,000.00 ක ශුද්ධ ප්‍රතිපාදනයක් ලැබී ඇත. 2014 ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කරමින් දෙවන කාර්තුව වන විට 54.43% ක් ද තුන්වන කාර්තුව වන විට 61.47% ක් ද හා හතර වන කාර්තුව වන විට 98.09% ප්‍රගතියක් අත් කර ගනිමින් 2014 වර්ෂය අවසානයේ 98.09 % ක මූල්‍ය ප්‍රගතියක් හිමි කරගෙන ඇත.

**<u>පුනරාවර්තන වියදම සංයුතිය - 2014 වර්ෂය</u>**
**<u>ප්‍රාදේශීය ලේකම් කාර්යාල</u>**

| වැය විස්තරය | සත්‍ය වියදම රු. |
|---|---|
| පුද්ගල පඩිනඩි | 667,222,909 |
| ගමන් වියදම් | 16,453,052 |
| සැපයීම් | 18,919,239 |
| නඩත්තු වියදම් | 11,212,713 |
| සේවා | 35,039,110 |
| මාරු කිරීම් | 10,435,134 |
| **එකතුව** | **759,282,157** |




2014 වර්ෂයේ වැඩසටහන අනුව ශුද්ධ ප්‍රතිපාදනය සහ වියදම පහත සඳහන් පරිදිය.

| විස්තරය | ශුද්ධ ප්‍රතිපාදනය | මුළු වියදම |
|---|---|---|
| පුනරාවර්තන වියදම | 890,575,000 | 884,423,303 |
| මූලධන වියදම් | 45,800,000 | 45,617,586 |
| එකතුව | 936,375,000 | 930,040,889 |

### 4.1.2 ග්‍රාම නිළධාරි කටයුතු

ගාල්ල දිස්ත්‍රික්කයේ පරිපාලන ව්‍යුහයට අනුව ග්‍රාම නිළධාරි වසම් 896 ක් ඇත. 2014.12.31 දිනට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ අනුව සිටින ග්‍රාම නිළධාරි සංඛ්‍යාව හා පුරප්පාඩු සංඛ්‍යාව පහත සඳහන් පරිදිය.

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ග්‍රාම නිළධාරී වසම් ගණන | 2014.01.01 දිනට ග්‍රාම නිලධාරීන් සංඛ්‍යාව | 2014.12.31 දිනට ග්‍රාම නිලධාරීන් සංඛ්‍යාව | 2014.12.31 දිනට පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| කඩවත් සතර | 50 | 41 | 43 | 07 |
| තවලම | 36 | 23 | 36 | - |
| නියාගම | 34 | 20 | 32 | 02 |
| අම්බලන්ගොඩ | 36 | 32 | 36 | - |
| කරන්දෙණිය | 40 | 23 | 40 | - |
| ඇල්පිටිය | 51 | 38 | 50 | 01 |
| නෙළුව | 34 | 29 | 34 | - |
| නාගොඩ | 53 | 39 | 50 | 03 |
| බලපිටිය | 52 | 40 | 51 | 01 |
| හික්කඩුව | 97 | 63 | 95 | 02 |
| අක්මීමණ | 63 | 44 | 61 | 02 |
| බෙන්තොට | 51 | 38 | 50 | 01 |
| හබරාදූව | 59 | 42 | 59 | - |
| බද්දේගම | 70 | 42 | 66 | 04 |
| යක්කලමුල්ල | 44 | 29 | 38 | 06 |
| බෝපේ පෝද්දල | 44 | 38 | 39 | 05 |
| වැලිවිටිය | 20 | 08 | 20 | - |
| ඉමදූව | 43 | 31 | 43 | - |
| ගෝනපිනූවල | 19 | 10 | 18 | 01 |
| **එකතුව** | **896** | **630** | **861** | **35** |

### 4.1.3 අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රගතිය - 2014

2014 වසර තුලදී විගණන විමසුම් 21 ක් ලැබී ඇති අතර එයින් 12 ක් සඳහා විගණකාධිපති වෙත පිළිතුරු යවා ඇත.

දිස්ත්‍රික් ලේකම්ගේ කමිටු සභාපතිත්වයෙන් යුතුව විගණන කළමනාකරණ කමිටු රැස්වීම් පහත සඳහන් දිනවල පවත්වා ඇත .

| කාර්තුව | දිනය |
|---|---|
| පළමු | 2014.04.26 |
| දෙවන | 2014.07.10 |
| තෙවන | 2014.10.13 |

2014 වර්ෂය තුළදී ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 19 හිම අභ්‍යන්තර විගණන පරීක්ෂාවන් සිදු කොට කාර්යාල 9ක වාර්තා ඉදිරිපත් කර ඇත. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සම්බන්ධයෙන් 2014 වර්ෂය තුළදී අභ්‍යන්තර විගණන පරීක්ෂාවන් සිදු කොට වාර්තා 6 ක් භාරදී ඇත.

උක්ත දින වල පවත්වන ලද විගණන කළමණාකරණ කමිටු රැස්වීම් වල වාර්තා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්ට පිටපතක්ද සහිතව විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත.

### 4.1.4.විමර්ශන හා මෙහෙයුම් ඒකකයේ ප්‍රගතිය - 2014

මෙම අංශය මගින් රජයේ නිලධාරීන් ගේ විනය කඩවීම් සම්බන්ධයෙන් මූලික විමර්ශන පවත්වන අතර කාර්යාල කටයුතු වල අඩුපාඩු සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වනු ලබයි.

ඒ අනුව 2014 වර්ෂයේ මූලික විමර්ශන 9 ක් පවත්වා ඇති අතර පරීක්ෂණ 11 ක් පවත්වා ඇත. මෙම මූලික විමර්ශන හා පරීක්ෂණ වලට භාජනය වූ නිලධාරීන් සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග පහත සඳහන් පරිදිය.

- නිදහසට කරුණු විමසීම් - 05
- II වන උපලේඛනය යටතේ චෝදනාපත්‍ර නිකුත් කිරීම් - 02
- I වන උපලේඛනය යටතේ චෝදනාපත්‍ර නිකුත් කිරීම් - 01
- මුදල් අය කර ගැනීම් - 01
- අවවාද කිරීම් - 02
- ස්ථාන මාරු කිරීම් - 01
- අනාවරණය වූ අඩුපාඩු නිවැරදි කර ගැනීමට දැනුම් දීම් - 09

### 4.1.5 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ‘බී’ ගිණුම - 2014

2014 වර්ෂය සඳහා රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ‘බී’ ගිණුමේ සීමා සහ සත්‍ය වියදම පහත සඳහන් පරිදි වේ.

| | උපරිම වියදම් සීමාව (රු:ශත) | අවම ලැබීම් සීමාව (රු:ශත) | උපරිම හර ශේෂ සීමාව (රු:ශත) |
|---|---|---|---|
| 2014 වර්ෂයේ ඇස්තමේන්තුව අනුව අනුමත සීමාව | 52,000,000.00 | 47,000,000.00 | 235,000,000.00 |
| 2014 වර්ෂයේ සත්‍ය අගයන්<br>261011<br>261012 | 51,881,936.82<br>10,756,088.10 | 47,783,044.00<br>8,878,159.50 | 204,052,922.49 |

### 4.1.6 ගාල්ල දිස්ත්‍රික් ලේකම් විසින් එක් රැස් කරන ලද ආදායම - 2014 වර්ෂය

දිස්ත්‍රික්කය තුළ ඇති රජයට අයවිය යුතු ආදායම්, රජයේ නියෝජිතයා වශයෙන් නියමිත පරිදි නියමිත වේලාවට එක්රැස් කර දීම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වගකීමක් වනු ඇත. ඒ යටතේ එක් එක් දෙපාර්තමේන්තු වලට අදාළ ආදායම් එක් රැස් කර මාසිකව අදාළ ආදායම් ගණන් දීමේ නිලධාරීන් වෙත බැර වාර්තා මගින් නිවේදනය කොට ඇති අතර මාසික ගිණුම් සාරාංශ මගින් අදාල ආදායම් මහා භාණ්ඩාගාරයට නිවේදනය කර ඇත. ඒ අනුව 2014 වර්ෂය තුළ එක්රැස් කරන ලද ආදායම් පිළිබඳ තොරතුරු පහත සඳහන් පරිදි වේ.

| ආදායම් ශීර්ෂය | ආදායම් ගණන් දීමේ නිලධාරි | විස්තරය | 2014 වර්ෂය තුළ එක්රැස් කළ ආදායම රු: ශත |
|---|---|---|---|
| 10-03-07-02 | රෙජිස්ට්‍රාර් ජනරාල් | ලියාපදිංචි කිරීමේ ගාස්තු | 33,857,350.00 |
| 10-03-07-03 | වන සංරක්ෂණ | පෞද්ගලික දැව ප්‍රවාහනය | 1,588,082.54 |
| 10-03-07-05 | මහජන ආරක්ෂාව හා නීතිය හා සාමය පිළිබඳ ලේකම් | මහජන ආරක්ෂාව හා නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයට අදාළ බලපත්‍ර ගාස්තු | 205,480.00 |
| 10-03-07-99 | ස්වදේශ කටයුතු ලේකම් | අනෙකුත් බලපත්‍ර ගාස්තු | 7,931,280.78 |
| 20-02-01-01 | රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් | රජයේ ගොඩනැගිලි කුලී | 1,169,691.54 |
| 20-02-01-02 | වන සංරක්ෂක | රජයේ කැළෑ වලින් ලැබෙන ආදායම | 280.00 |
| 20-02-02-99 | රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් | පොළිය - වෙනත් | 8,334,084.30 |
| 20-03-02-13 | විභාග කොමසාරිස් ජනරාල් | විභාග හා අනෙකුත් ගාස්තු | 8,660,682.00 |
| 20-03-02-14 | මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් | මෝටර් රථ ප්‍රවාහන පනත යටතේ ගාස්තු | 47,030,230.00 |
| 20-03-02-99 | රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් | විකුණුම් හා ගාස්තු - විවිධ | 282,126.41 |
| 20-03-99-00 | රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් | විකුණුම් හා ගාස්තු - අනෙකුත් | 30,578,726.67 |
| 20-03-04-00 | රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් | ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා යතුරු පැදි ලබා දීම | 343,085,500.00 |
| 20-04-01-00 | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ | සමාජ සංරක්ෂණ දායක මුදල් | 45,246,431.78 |
| එකතුව | | | **527,969,946.02** |




ප්‍රාදේශීය ලේකම් කාර්යාල 19 සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් දිස්ත්‍රික්කය තුළ ඇති රජයට අයවිය යුතු ආදායම්, මෙසේ ආදායම් ශීර්ෂ 13 ක් ඔස්සේ එකතු කර අදාළ ආදායම් ගණන් දීමේ නිලධාරීන් වෙත මාසික බැර වාර්තා මගින් වාර්තා කර ඇත. මෙම ආදායම් ශීර්ෂ වලින් මා විසින් ඇස්තමේන්තු සකස් කරනු ලබන්නේ ස්වදේශ කටයුතු ලේකම්ගේ , රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ , වන සංරක්ෂක ගේ සහ රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශ ලේකම් ගේ ආදායම් ශිර්ෂ සම්බන්ධයෙන් පමණි.

2014 ඇස්තමේන්තු ගත ආදායම් ඉලක්කයන් පවා අභිබවා යමින් ආදායම් රැස් කිරීමට ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සමත් වී ඇති බව පහත සටහන තුළින් මනාව පැහැදිලි වේ.

| ආදායම් ශීර්ෂය | 2014 ඇස්තමේන්තු ගත ආදායම් රු. ශත | මූල්‍යමය කාර්ය සාධනය රු: | | |
|---|---|---|---|---|
| | | 2014 වර්ෂය තුළ රැස් කරන ලද ආදායම් රු. ශත | පසුගිය වර්ෂය තුළ (2013) රැස් කරන ලද ආදායම රු. ශත | හිඟ ආදායම 2014.12.31 |
| 10-03-07-02 | - | 33,857,350.00 | 30,009,532.00 | - |
| 10-03-07-03 | - | 1,588,082.54 | 2,413,474.96 | - |
| 10-03-07-05 | 200,650.00 | 205,480.00 | 224,770.00 | 301,500.00 |
| 10-03-07-99 | 6,000,000.00 | 7,931,280.78 | 6,558,304.92 | - |
| 20-02-01-01 | 1,070,000.00 | 1,169,691.54 | 1,181,664.77 | - |
| 20-02-01-02 | - | 280.00 | 110,182.98 | 45,065.61 |
| 20-02-02-99 | 8,300,000.00 | 8,334,084.30 | 8,343,079.14 | - |
| 20-03-02-06 | - | - | 350.00 | - |
| 20-03-02-07 | - | - | 540,000.00 | - |
| 20-03-02-13 | - | 8,660,682.00 | 2,737,773.00 | - |
| 20-03-02-14 | - | 47,030,230.00 | 42,574,975.00 | - |
| 20-03-02-99 | 300,000.00 | 282,126.41 | 394,990.30 | - |
| 20-03-99-00 | 18,000,000.00 | 30,578,726.67 | 41,581,877.72 | - |
| 20-03-04-00 | - | 343,085,500.00 | - | - |
| 20-04-01-00 | - | 45,246,431.78 | 42,835,668.38 | - |

2014 වර්ෂයේ ආදායම් එක්රැස් කිරීමේ ක්‍රියාවලියේදි බලපත්‍ර නිකුත් කිරීමේ භෞතික කාර්ය සාධනයෙහි ප්‍රගතිය පහත සඳහන් පරිදිය.

| භෞතික කාර්ය සාධනය 10-03-07-99 බලපත්‍ර ගාස්තු (වෙනත්) | |
|---|---|
| විස්තරය | 2014 වර්ෂයේ නිකුත් කළ බලපත්‍ර ගණන |
| මාසික ආදායම් සහතික | 36 |
| වාර්ෂික ආදායම් සහතික | 4,721 |
| වටිනාකම් සහතික | 59 |
| බලපත්‍ර පිටපත් | - |

| භෞතික කාර්ය සාධනය 10-03-07-05 ගිනි අවි හා පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර | |
|---|---|
| විස්තරය | 2014 වර්ෂයේ නිකුත් කළ බලපත්‍ර ගණන |
| පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර | 239 |
| ගිණි අවි බලපත්‍ර | 580 |
| ගිණි අවි ඉල්ලුම් පත්‍ර | 23 |
| පෞද්ගලික ආරක්ෂණ ආයතන ලියාපදිංචි කිරීම් | 02 |

| භෞතික කාර්ය සාධනය 10-03-07-03 දැව ප්‍රවාහන බලපත්‍ර | |
|---|---|
| විස්තරය | 2014 වර්ෂයේ නිකුත් කළ බලපත්‍ර ගණන |
| දැව ප්‍රවාහන බලපත්‍ර | 3,199 |

## 4.1.7 පොදු තැන්පත් ගිණුම

2014 වර්ෂයේ ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විවිධ තැන්පත් ගිණුම් වල ලැබීම්, ගෙවීම් සහ 2014.12.31 දිනට අවසාන ශේෂය පහත සඳහන් පරිදිය.

| තැ. විවිධ ගිණුම් අංකය | 2014.01.01 දිනට ආරම්භක ශේෂය ( රු:ශත) | 2014 වර්ෂය තුළ ලැබීම් ( රු:ශත) | 2014 වර්ෂය තුළ ගෙවීම් ( රු:ශත) | 2014.12.31 දිනට අවසාන ශේෂය ( රු:ශත) |
|---|---|---|---|---|
| 6003/0/0/37/0 | 276,207,075.03 | 347,972,338.93 | 179,295,416.15 | 444,883,997.81 |

## 4.1.8. රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වල වියදම් පිළිබඳ ප්‍රගතිය - 2014

261 වැය ශීර්ෂයට අදාළ ගෙවීම් හැරුණු විට ගාල්ල දිස්ත්‍රික් ලේකම් විසින් 2014 වර්ෂය සඳහා රේඛීය අමාත්‍යාංශ , දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ දරණ ලද වියදම රු. 4,926,468,810.54 කි.

| වැය ශීර්ෂය | විස්තරය | ප්‍රාග්ධන වියදම රු: ශත | පුනරාවර්තන වියදම රු: ශත |
|---|---|---|---|
| 101 | බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය | 7,114,842.00 | - |
| 102 | මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය | - | 190,392.00 |
| 103 | රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය | 155,730.00 | 38,988.00 |
| 105 | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 2,269,267,217.00 | 386,975,410.00 |
| 106 | ආපදා කළමනාකරණ අමාත්‍යාංශය | 19,810,888.00 | 9,934,852.80 |
| 110 | අධිකරණ අමාත්‍යාංශය | - | 10,873,875.00 |
| 116 | සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය | - | 637,392.00 |
| 117 | වරාය හා මහා මාර්ග අමාත්‍යාංශය | 50,514.00 | - |
| 118 | කෘෂිකර්ම අමාත්‍යාංශය | 3,167,512.00 | 21,595,666.00 |
| 120 | ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය | 6,705,603.00 | 10,621,312.00 |
| 121 | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 3,499,889.00 | 2,521,825.00 |
| 124 | සමාජ සේවා අමාත්‍යාංශය | 1,343,325.00 | 147,542,357.00 |
| 128 | සාම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාශය | 204,960.00 | - |
| 133 | තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය | 1,891,401.00 | 3,897,688.00 |
| 134 | ජාතික භාෂා සහ සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය | 19,544.00 | 123,361.00 |
| 136 | ක්‍රීඩා අමාත්‍යාංශය | 2,580,062.00 | - |
| 138 | දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | 225,378.00 | 106,208.00 |
| 139 | ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | 1,464,999.00 | - |
| 153 | ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය | 75,265,408.00 | 7,755,416.00 |
| 156 | යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය | 947,584.00 | 538,266.00 |
| 160 | පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය | 26,835.00 | - |
| 177 | සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය | 651,170.00 | - |
| 181 | ඵලදායීතා ප්‍රවර්ධන අමාත්‍යාංශය | - | 12,209,091.00 |
| 182 | විදේශ රැකියා ප්‍රවර්ධන අමාත්‍යාංශය | 534,698.00 | 19,577,516.00 |
| 184 | පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යාංශය | 3,199,618.00 | - |
| 185 | විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය | 1,858,300.00 | - |
| 201 | බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව | 2,878,559.00 | 12,332,563.00 |
| 206 | සංස්කෘතික දෙපාර්තමේන්තුව | 16,507.50 | 315,000.00 |
| 210 | රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව | - | 8,000.00 |
| 216 | සමාජ සේවා දෙපාර්තමේන්තුව | 498,800.00 | 11,335,162.00 |
| 217 | පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව | - | 12,211,989.00 |
| 218 | සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව | - | 725,247,037.00 |
| 219 | ක්‍රීඩා සංවර්ධන අමාත්‍යාංශය | - | 78,295.00 |
| 227 | පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව | - | 12,593,582.00 |
| 252 | ජන ලේඛන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව | 22,093,770.00 | 1,354,742.50 |

| | | | |
|---|---|---|---|
| 253 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | - | 1,076,451,810.00 |
| 254 | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | 5,735,000.00 | 3,767,872.00 |
| 281 | ගොවිජන සේවා දෙපාර්තමේන්තුව | - | 36,736.00 |
| 285 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 550,424.00 | - |
| 304 | කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව | 144,002.00 | - |
| 307 | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | 127,347.00 | 444,327.74 |
| 326 | ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව | - | 22,340.00 |
| 327 | ඉඩම් පරිහරන ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව | 1,335,091.00 | 502,270.00 |
| 328 | මිනිස් බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව | 633,080.00 | 629,411.00 |
| | **එකතුව** | **2,433,998,057.50** | **2,492,470,753.04** |

## 4.1.9. පුහුණු කිරීම් කටයුතු පිළිබඳ ප්‍රගතිය - 2014 (වැය විෂය 261-1-1-0-2401, 261-1-2-0-2401)

| අංකය | පාඨමාලාවේ නම | සහභාගී වූ සංඛ්‍යාව | වැය කල ප්‍රතිපාදන රු. ශත |
|---|---|---|---|
| 01 | වැටුප් පරිවර්තන පුහුණු පාඨමාලාව (දි. ලේ. කාර්යාලය) | 66 | 23 ,700.00 |
| 02 | අන්තර් ජාලය මගින් ප්‍රතිපාදන හා අක් මුදල් බෙදා හැරීම | | 15,600.00 |
| 03 | දි.ලේ.කාර්යාල නිලධාරීන් ගේ සිවි දින වැඩ මුළු ( i , ii ) | 50 | 86,635.00 |
| 04 | සමාජ වගකීම්යිතා වැඩ සටහන් 8 (දි.ලේ.කා) | 517 | 99,033.00 |
| 05 | විදේශ අධ්‍යයන වැඩ සටහන් (දි.ලේ.කා., ප්‍රා.ලේ.කා. කඩවත් සතර,ප්‍රා.ලේ.කා.වැලිවිටිය,ප්‍රා.ලේ.කා බද්දේගම , ප්‍රා.ලේ.කා යක්කලමුල්ල ) | 7 | 778,948.00 |
| 06 | 2015 පුහුණු සැලැස්ම සකස් කිරීම | 40 | 13,849.00 |
| 07 | නිල වාහන පරිපාලනය පිළිබඳ පුහුණුව | 40 | 16,929.50 |
| 08 | ග්‍රාම නිලධාරි කාර්යාල හා දින පොත් පවත්වා ගෙන යාම (ප්‍රා. ලේ.කා නාගොඩ) | 60 | 10,550.00 |
| 09 | රජයේ මුදල් රෙගුලාසි පුහුණුව ( ප්‍රා. ලේ.කා නාගොඩ , හබරාදුව) | 136 | 16,600.00 |
| 10 | කාර්යාල ක්‍රම/ලිපිගොනුකරණය (ප්‍රා. ලේ.කා නාගොඩ , නියාගම, බෙන්තොට, අම්බලන්ගොඩ, බලපිටිය, ඇල්පිටිය බද්දේගම, ගෝනපීනුවල) | 720 | 112,313.00 |
| 11 | කාර්යාල කළමනාකරණය හා කාර්යාල ක්‍රම ( ප්‍රා. ලේ.කා කරන්දෙනිය, හබරාදුව, අක්මීමණ, තවලම) | 515 | 55,150.00 |
| 12 | විනය පුහුණු පාඨමාලාව ( ප්‍රා. ලේ.කා කරන්දෙනිය, හික්කඩුව) | 120 | 27,400.00 |
| 13 | ආකල්ප සංවර්ධනය (ප්‍රා.ලේ.කා.කරන්දෙනිය, වැලිවිටිය) | 145 | 17,150.00 |
| 14 | මූල්‍ය කළමනානරණය ( ප්‍රා. ලේ.කා ඉමදුව, බෙන්තොට, වැලිවිටිය) | 311 | 41,245.00 |
| 15 | අභ්‍යන්තර හා බාහිර පාරිභෝගික සේවා සැපයීම (ප්‍රා.ලේ.කා.අක්මීමණ) | 91 | 8,600.00 |
| 16 | සන්නිවේදන හා මහජන සම්බන්ධතාවය (ප්‍රා.ලේ.කා. බලපිටිය) | 100 | 16,700.00 |
| 17 | රජයේ ඉඩම් සම්බන්ධව දැනුවත් කිරීම (ප්‍රා. ලේ.කා ඇල්පිටිය) | 152 | 13,700.00 |
| 18 | ගිණුම් ක්‍රම හා ලේඛන පවත්වාගෙන යාම ( ප්‍රා. ලේ.කා බද්දේගම) | 30 | 7,800.00 |
| 19 | ආයතන හා කාර්යාල කටයුතු i, ii (ප්‍රා. ලේ.කා බෝපේ පෝද්දල) | 149 | 17,825.00 |
| 20 | ඵලදායීතාව ඉහළ නැංවීම ( ප්‍රා. ලේ.කා බෙන්තොට) | 190 | 10,617.00 |
| 21 | වැටුප් පුහුණු පාඨමාලාව (ප්‍රා. ලේ.කා බෝපේ පෝද්දල) | 1 | 7,850.00 |
| 22 | කළමනාකරණ සහකාර උසස් ඩිප්ලෝමා පාඨමාලාව (ප්‍රා. ලේ.කා නෙළුව) | 1 | 5,000.00 |
| 23 | පොත් බැඳුම්කරු පුහුණුව (ගෝනපිණුවල ප්‍රා. ලේ.කා) | 1 | 1,250.00 |

මීට අමතරව කාර්මික විද්‍යාල හා වෘත්තීය පුහුණු කිරීම් ආයතනයේ පාඨමාලා හදාරන සිසුන් සඳහා 2014 වර්ෂය තුළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් ලබා දී ඇති ප්‍රායෝගික පුහුණු වීම් සංඛ්‍යාව පහත සඳහන් පරිදිය.

| අංකය | කාර්යාලය | පුහුණුව ලැබූ සිසුන් ගණන |
|---|---|---|
| 1 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ගාල්ල | 22 |
| 2 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 19 න් | 34 |
| | එකතුව | **56** |

## 2014 වර්ෂයේ රේඛීය අමාත්‍යාංශ ප්‍රතිපාදන මගින් කරන ලද වැඩ සටහන්

විවිධ රේඛිය අමාත්‍යාංශ දෙපාර්තමේන්තු ඔස්සේ ලැබෙන ප්‍රතිපාදන උපයෝජනය කරමින් ගාල්ල දිස්ත්‍රික්කය තුළ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් ම නියෝජනය වන පරිදි විවිධ සමාජ , ආර්ථික වැඩ සටහන් පවත්වමින් ඔවුන් දැනුවත් කිරිමේ කටයුතු සිදු කර ඇත. 2014 වසර තුළ එසේ කරන ලද වැඩ සටහන් වනුයේ,





| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | අදාල ක්ෂේත්‍රය | ප්‍රතිලාභ ලැබූ හෝ පුහුණු වීම් ලැබූ සංඛ්‍යාව | වැය කල මුදල රු. ශත |
|---|---|---|---|
| ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශය | දිරිය කාන්තා වැඩ සටහන | 3,189 | 712,370.98 |
| | ළමා සවිය වැඩ සටහන | 2,973 | 198,709.00 |
| | නැවුම් කිරි ලබා දීමේ වැඩ සටහන | 11,805 | 5,855,887.50 |
| | කැකුළු උද්‍යානය වැඩ සටහන | 6,600 | 744,078.00 |
| | කාන්තා සවිය වැඩ සටහන | 1,237 | 725,188.50 |
| | මුල් ළමා විය රැකවරණය වැඩ සටහන | 11,227 | 872,232.00 |
| | කාන්තා හිංසන හා ළමා අපයෝජන මර්දනය කිරීමේ වැඩ සටහන් | 3,780 | 1,336,434.80 |
| සමාජ සුභසාධන අමාත්‍යාංශය | මානසික සෞඛ්‍ය පිළිබඳ වැඩසටහන | 524 | 212,350.00 |
| | ප්‍රජා නායකයන් දැනුවත් කිරීම | 263 | 93,155.00 |
| | ජාතික උපදේශන දින බැනර් ප්‍රදර්ශනය | 376 | 22,000.00 |
| පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව | ප්‍රාදේශීය ළමා සංවර්ධන කමිටු | (කමිටු ) 84 | 57,000.00 |
| | කැපකරු ආධාර හා නැණ දිරිය | 126 | 738,700.00 |
| | වෛද්‍ය හා පෝෂණ ආධාර | 23 | 150,000.00 |
| | පාසල් උපකරණ හා අධ්‍යාපන ආධාර | 595 | 833,500.00 |
| | වතු ආශ්‍රිත ප්‍රජාව දැනුවත් කිරීම | 1,212 | 214,812.00 |
| | දැනුවත් කිරීමේ වැඩ සටහන් | 6,046 | 378,000.00 |
| | මිලියන 700 විශේෂ වැඩ සටහන | 18,526 | 2,860,000.00 |
| | නිවුන් දරු ආධාර | 46 | 217,000.00 |
| බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව | විවිධ සේවාවන් | 2,471 | 73,000.00 |
| | දහම් පාසල් ගුරුවරුන් සඳහා පුස්තකාල දීමනාව | 4,903 | 16,214,000.00 |
| සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | ප්‍රාදේශීය සාහිත්‍ය උත්සවය | 8,474 | 350,000.00 |
| | සාහිත්‍ය රසාස්වාදන වැඩ මුළුව | 300 | 20,000.00 |
| තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය | පින්තූර රාමු කිරීම | 78 | 14,171.00 |
| | සබන් නිෂ්පාදනය | 132 | 15,624.00 |
| | LED බල්බ් නිෂ්පාදනය | 294 | 43,037.20 |
| | බිම් මල් නිෂ්පාදනය | 308 | 36,483.50 |
| | කිරි ආශ්‍රිත නිෂ්පාදන | 207 | 22,235.50 |
| | හඳුන්කූරු, ඉටි පන්දම් නිෂ්පාදනය | 422 | 44,547.00 |
| | කුළු බඩු නිෂ්පාදනය | 164 | 16,352.50 |
| | මාළු ආශ්‍රිත නිෂ්පාදන | 124 | 12,424.00 |
| | සේදුම් කාරක දියර නිෂ්පාදන | 312 | 46,562.70 |
| | කෑම වර්ග නිෂ්පාදනය | 1,667 | 167,753.79 |
| | කොසු, ඉදල් නිෂ්පාදන | 75 | 5,408.00 |
| | පාවහන් නිෂ්පාදන | 335 | 53,808.00 |
| | බෑග් පාපිසි නිෂ්පාදන | 283 | 40,579.13 |
| | තාක්ෂණ පැවරුම් වැඩ සටහන | 1,187 | 85,808.50 |
| | අලෙවිකරණය/ඇසුරුම්කරණය | 434 | 38,380.00 |
| | විසිතුරු මල් වගාව | 262 | 21,424.00 |
| | බීම වර්ග නිෂ්පාදනය | 152 | 12,536.50 |
| | ආහාර ද්‍රව්‍ය විජලනය | 150 | 19,682.71 |
| | විසිතුරු නිර්මාණ වැඩ සටහන | 119 | 15,045.00 |
| | ස්ක්‍රීන් ප්‍රින්ටින්/ග්‍රැෆික් නිර්මාණ | 255 | 42,219.00 |
| | ගම් වර්ග නිෂ්පාදනය | 97 | 12,902.00 |
| | දිස්ත්‍රික් ප්‍රදර්ශනය | - | 110,001 |

### 4.1.10. ප්‍රාදේශීය පරිපාලනයේ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම සඳහා 2014 වර්ෂයේ පවත්වන ලද රැස්වීම්

දිස්ත්‍රික්කය තුල ප්‍රාදේශීය ලේකම්වරු 19 දෙනා සමග ප්‍රාදේශීය පරිපාලන කටයුතු මෙහෙයවීමේ ප්‍රධානියා වශයෙන් ප්‍රාදේශීය පාලනයට අවශ්‍ය මග පෙන්වීම හා උපදෙස් අඛණ්ඩව ලබා දීම සඳහා ප්‍රාදේශීය ලේකම් සාකච්ඡා වාර 09 ක් 2014 වර්ෂය තුළ පවත්වා ඇත.

| | රැස්වීම පැවැත්වූ දිනය | රැස්වීම පැවැත්වූ ස්ථානය |
|---|---|---|
| 1 | 2014.01.07 | ප්‍රාදේශිය ලේකම් කාර්යාලය - නියාගම |
| 2 | 2014.02.13 | ප්‍රාදේශිය ලේකම් කාර්යාලය - කරන්දෙණිය |
| 3 | 2014.03.18 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ගාල්ල |
| 4 | 2014.05.08 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ගාල්ල |
| 5 | 2014.06.06 | ප්‍රාදේශිය ලේකම් කාර්යාලය - තවලම |
| 6 | 2014.07.01 | ප්‍රාදේශිය ලේකම් කාර්යාලය - බලපිටිය |
| 7 | 2014.08.05 | ප්‍රාදේශිය ලේකම් කාර්යාලය - කඩවත් සතර |
| 8 | 2014.10.07 | ප්‍රාදේශිය ලේකම් කාර්යාලය - අක්මීමණ |
| 9 | 2014.11.04 | ප්‍රාදේශිය ලේකම් කාර්යාලය - යක්කලමුල්ල |

### 4.1.11. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හෝල් ඩි ගෝල් ශාලාව.

2004.12.26 දින සුනාමි ව්‍යසනයෙන් විනාශ වු ගාල්ල බාල දක්ෂ මාවතේ පිහිටා තිබු දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් සම්මන්ත්‍රන ශාලාව, රාජ්‍ය නොවන සංවිධානයක් වන USAID ආයතනයේ අනුග්‍රහය යටතේ ප්‍රති සංස්කරණ කර " හෝල් ඩි ගෝල් ශාලාව" ලෙස නම් කර ඇත.

රාජ්‍ය අංශයේ ආයතනයක් විසින් පවත්වා ගෙන යන සියලු පහසුකම් වලින් සමන්විත නාට්‍ය ශාලාවක් නොමැති වීම මෙතෙක් ගාල්ල නගරයට විශාල අඩු පාඩුවක්ව පැවතුනි. මෙම හෝල්ඩි ගෝල් ශාලාව නිසා එම අඩුපාඩුව සම්පූර්ණ වු අතර සහනදායි පදනම මත රජයේ දෙපාර්තමේන්තු අමාත්‍යාංශ ව්‍යවස්ථාපිත මණ්ඩල හා සමිති සමාගම් වල විවිධ අවශ්‍යතාවයන් සඳහා සහ මංගල උත්සව ප්‍රිය සම්භාෂණ සඳහා ද (කොන්දෙසි සහිතව) සහනදායී පදනම මත මෙම ශාලාව ලබා ගත හැකිය.

**හෝල් ඩි ගෝල් ශාලාවේ ආදායම - 2014.**

| මාසය | ආදායම රු. ශත. |
|---|---|
| ජනවාරි | 309,980.00 |
| පෙබරවාරි | 101,300.00 |
| මාර්තු | 228,100.00 |
| අප්‍රේල් | 212,400.00 |
| මැයි | 207,800.00 |
| ජුනි | 453,800.00 |
| ජුලි | 136,400.00 |
| අගෝස්තු | 169,500.00 |
| සැප්තැම්බර් | 143,600.00 |
| ඔක්තෝබර් | 442,000.00 |
| නොවැම්බර් | 109,000.00 |
| දෙසැම්බර් | 65,000.00 |
| එකතුව | 2,578,880.00 |



### 4.1.12. ඉඩම් රෙජිස්ට්‍රාර් කටයුතුවල ප්‍රගතිය - 2014

| විස්තරය | සංඛ්‍යාව |
|---|---|
| ලබා දී ඇති ඉ.සං.ආ. බලපත්‍ර සංඛ්‍යාව | 9,386 |
| ලබා දී ඇති දීමනා බලපත්‍ර සංඛ්‍යාව | 6,006 |
| ලබා දී ඇති දීර්ඝ කාලීන බදුකර සංඛ්‍යාව | 47 |
| ඉඩම් කොමසාරිස් වෙත නිර්දේශ කර ඇති දීර්ඝ කාලීන බදුකර ගණන | 184 |
| නිකුත් කර ඇති ප්‍රජා ඔප්පු ගණන | 06 |
| පවත්වන ලද ඉඩම් කච්චේරි ගණන | 121 |
| පවත්වන ලද කොට්ඨාශ දින ගණන | 130 |
| ඒ අනුව වර්ෂය තුළ ලබා දුන් මුළු ඉඩම් කට්ටි සංඛ්‍යාව | 50 |
| විසඳන ලද ඉඩම් ආරවුල් ගණන | 748 |
| අනවසර නීත්‍යානුකූල කිරීම් සඳහා නිර්දේශ කල සංඛ්‍යාව | 1,592 |
| ඒ යටතේ ලබා දුන් බලපත්‍ර ගණන | 67 |
| යවා ඇති මැනුම් නියෝග ගණන | 1,537 |
| ලැබී ඇති මැනුම් විස්තර ගණන | 466 |
| ඉවත්කරන ලද අනවසර කරුවන් ගණන | 36 |
| සන්තකය ආපසු ලබා ගැනීම සඳහා පවරනු ලැබූ නඩු සංඛ්‍යාව | 12 |
| සන්තකය ආපසු ලබා ගැනීම සඳහාවර්ෂය තුල කටයුතු කල ඉඩම් ගණන | 29 |

### 4.1.13. ලියාපදිංචි කිරීම් කටයුතු වල ප්‍රගතිය - 2014

2014 වර්ෂය තුල ගාල්ල දිස්ත්‍රික්කයට අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල 19 විසින් කරන ලද උපත්, විවාහ සහ මරණ ලියා පදිංචි කිරීම් වලට අදාල තොරතුරු පහත සඳහන් පරිදිය.

| විස්තරය | සංඛ්‍යාව |
|---|---|
| වර්ෂය තුල ලියාපදිංචි කල උප්පැන්න ගණන | 17,643 |
| වර්ෂය තුල ලියාපදිංචි කල මරණ ගණන | 7,439 |
| වර්ෂය තුල ලියාපදිංචි කල විවාහ ගණන | 9,049 |
| වර්ෂය තුල ලියාපදිංචි කල ඉඩම් ගණන | 284 |

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | උපත් සංඛ්‍යාව | මරණ සංඛ්‍යාව | විවාහ සංඛ්‍යාව | ඉඩම් |
|---|---|---|---|---|
| කඩවත්සතර | 12,358 | 3,038 | 1,378 | |
| තවලම | 113 | 144 | 306 | - |
| නියාගම | 1 | 194 | 357 | - |
| අම්බලන්ගොඩ | 46 | 303 | 506 | 95 |
| කරන්දෙණිය | 14 | 223 | 498 | - |
| ඇල්පිටිය | 2,436 | 508 | 408 | - |
| නෙළුව | 9 | 83 | 265 | - |
| නාගොඩ | 135 | 293 | 387 | - |
| බලපිටිය | 2,400 | 373 | 353 | 84 |
